# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2324/50 - 2023 මාර්තු මස 24 වැනි සිකුරාදා - 2023.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උප ලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උප ලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග (පා.ම),**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 මාර්තු මස 02 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'' සුභූතිපුර පාර,
බත්තරමුල්ල.


1A - G 39187 — 36 (2023/03)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය I*

**බුත්තල නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම**

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කල අංක 455/21 හා 1987.05.28 දින දරන මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල නාගරික ප්‍රදේශයට අයත් වන්නා වූ අංක 140/ඒ යුධගනාව ග්‍රාම නිලධාරි වසමේ කොටසක් ද අංක 142 මැදගම ග්‍රාම නිලධාරි වසමේ කොටසක් ද, අංක 690/8 දරන 1991.11.26 දින ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත් කරන ලද අංක 140 උඩගම ග්‍රාම නිලධාරි වසම ද, අංක 1605/41 දරන 2009.06.11 දිනැති ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද අංක 143/1 හොරබොක්ක ග්‍රාම නිලධාරි වසම ද, අංක 143/2 උඩඅරාව ග්‍රාම නිලධාරි වසම ද, අංක 143 පැල්වත්ත ග්‍රාම නිලධාරි වසම ද, අංක 143/ඒ/1 මහසෙන්පුර ග්‍රාම නිලධාරි වසම ද, අංක 143/ඒ/2 කුමාරගම ග්‍රාම නිලධාරි වසම ද, අංක 143/ඒ කුකුරම්පොළ ග්‍රාම නිලධාරි වසම ද, අංක 140/ඒ/1 උණාවටුන ග්‍රාම නිලධාරි වසම ද, අංක 142/3 පුහුල්කොටුව ග්‍රාම නිලධාරි වසම ද, අංක 142/1 වගුරුවෙල ග්‍රාම නිලධාරි වසම ද, අංක 145/බී ගම්මිණිපුර ග්‍රාම නිලධාරි වසම ද, අංක 145 ඔක්කම්පිටිය ග්‍රාම නිලධාරි වසම ද, අංක 145/බී/1 ගල්ටැම්මණ්ඩිය ග්‍රාම නිලධාරි වසම ද, අංක 145/1 පහළගම ග්‍රාම නිලධාරි වසම ද, අංක 145/ඒ/1 උළුගල ග්‍රාම නිලධාරි වසම ද, අංක 145/බී/2 බුරුතගොල්ල ග්‍රාම නිලධාරි වසම ද, අංක 142/ඒ කෝන්කැටිය ග්‍රාම නිලධාරි වසමේ කොටසක්ද අංක 142/2 යටියල්ලාතොට ග්‍රාම නිලධාරි වසම ද, අංක 140/බී කුමාරපුර ග්‍රාම නිලධාරි වසම ද, අංක 143/ඒ/3 රහතන්ගම ග්‍රාම නිලධාරි වසම ද හා අංක 143/බී/1 වෙහෙරගල ග්‍රාම නිලධාරි වසම යන ග්‍රාම නිලධාරි වසම්වලට අමතරව අංක 140/2 මහගෙ ාඩයාය ග්‍රාම නිලධාරි වසම ද, අංක 140/1 පෙට්ටගම්වෙල ග්‍රාම නිලධාරි වසම ද, අංක 140/3 දික්යාය ග්‍රාම නිලධාරි වසම ද, අංක 140/ඒ යුධගනාව ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 142 මැදගම ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද යන ග්‍රාම නිලධාරි කොට්ඨාස අයත් වන්නා වූ මෙහි II වැනි තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

*II වැනි තීරුව*

*උතුරට :*

අංක 143 පැල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම අංක 143/2 උඩඅරාව ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමු වන ලක්ෂයෙන් ආරම්භ වී අංක 143/2 උඩඅරාව ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නිරිත, උතුරු හා නැගෙනහිර දිශානුගතව ඇඳි රේඛාව අංක 143/1 හොරබොක්ක ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට අංක 143/1 හොරබොක්ක ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නිරිත, නැගෙනහිර හා දකුණු දිශානුගතව ඇඳි රේඛාව අංක 143/ඒ/1 උණාවටුන ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට අංක 143/ඒ/1 උණාවටුන ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව අඳින ලද රේඛාව අංක 140/ඒ යුධග නාව ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට අංක 140/ඒ යුධගනාව ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර හා දකුණු දිශානුගතව අඳින ලද රේඛාව අංක 140/3 දික්යාය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට අංක 140/3 දික්යාය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ උතුරු හා නැගෙනහිර දිශානුගතව ඇඳි රේඛාව අංක 140/2 මහගොඩයාය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 140/2 මහගොඩයාය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙ නහිර දිශානුගතව අඳින ලද රේඛාව අංක 145/බී ගාමිණීපුර ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 145/බී ගාමිණීපුර ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව අඳින ලද රේඛාව අංක 145/බී/1 ගල්ටැම්මණ්ඩිය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 145/බී/1 ගල්ටැම්මණ්ඩිය ග්‍රාම නිලධාරි වසමේ උතුරු හා නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොණ දිශානුගතව අඳින ලද රේඛාව අංක 145/ඒ/1 උළුගල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 145/ඒ/1 උළුගල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දිශානුගතව අඳින ලද රේඛාව අංක 145/ඒ මාළිගාවිල ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලකෂ්‍යය දක්වා ද,

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 145/ඒ/1 උළුගල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දෙසට අඳින ලද රේඛාව අංක 145/බී/2 බුරුතගොල්ල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමු වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 145/බී/2 බුරුතගොල්ල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දෙසට අඳින ලද රේඛාව කුඹුක්කන් ඔයේ මධ්‍ය රේඛාව සහ හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 142/ඒ කෝන්කැටිය ග්‍රාම නිලධාරි වසමේ නැගෙ නහිර මායිම ආරම්භ වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 142/ඒ කෝන්කැටිය ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු හා බටහිර දිශානුගතව අඳින ලද රේඛාව මැණික්

ගගේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට මැණික් ගගේ මධ්‍ය රේඛාව ඔස්සේ අකුණු නිරිත දකුණු දිශානුගව අදින ලද රේඛාව අංක 142/2 යටියල්ලතොට ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 142/2 යාටියල්ලතොට ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ නිරිත දිශානුගතව අඳිනු ලබන රේඛාව අංක 140/බී කුමාරපුර ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු දිශානුගතව ඇඳි රේඛාව මැණික් ගගේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතන් සිට මැණික් ගගේ මධ්‍ය රේඛාව ඔස්සේ සකුණු, නිරිත නැගෙනහිර, දකුණ, ගිනිකොණ, දකුණ හා ගිනිකොණ දිශානුගතව අඳිනු ලබන රේඛාව අංක 143/ඒ/3 රහතන්ගම ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද,

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට මැණික් ගගේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දිශානුගතව ඇඳි රේඛාව හන්ගුනේ ආරෙහි මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද,

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට හන්ගුනේ ආරෙහි මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දිශානුගතව ඇඳි රේඛාව අංක 143/ඒ/3 රහතන්ගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 143/ඒ/3 රහතන්ගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ වයඹ හා උතුරු දිශානුගතව අඳින ලද රේඛාව අංක 143/ඒ/2 කුමාරගම ග්‍රාම නිලධාරි වසමේ දකුණ හා බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 143/ඒ/2 කුමාරගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු දිශානුගතව අඳින ලද රේඛාව අංක 143/ඒ/1 මහසෙන්පුර ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 143/ඒ/1 මහසෙන්පුර ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුරු හා නැගෙනහිර දිශානුගතව අඳින ලද රේඛාව අංක 143 පැල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 143 පැල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ වයඹ දිශානුගතව අඳින ලද රේඛාව අංක 143/2 උඩඅරාව ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිමේ පිහිටි ආරම්භක ලක්ෂ්‍යය දක්වා ඇතුළත් මුළු භූමි ප්‍රදේශය වේ.

EOG 03 - 0331

**රෙජිඩේල්වත්ත විශේෂ ව්‍යාපෘති කලාපය සඳහා ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රය අවලංගු කිරීම**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2017.07.03 වැනි දින හා අංක 1504/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* ප්‍රකාරව විශේෂ ව්‍යාපෘති කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද කැස්බෑව සැලසුම් බල ප්‍රදේශයට අයත් රෙජිඩේල්වත්ත විශේෂ ව්‍යාපෘති ප්‍රදේශය තවදුරටත් විශේෂ ව්‍යාපෘති ප්‍රදේශයක් ලෙස ක්‍රියාත්මක නොවන බවත්, ඒ අනුව එකී 2017.07.03 වැනි දින අංක 1504/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මෙයින් අවලංගු කරන බව දැනුම් දෙමි.

**ප්‍රසන්න රණතුංග (පා.ම),**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 මාර්තු මස 14 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'' සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.